# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,727/8 — 1966 දෙසැම්බර් 28 වැනි බදාදා — 1966.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(මෙයින් වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනත

#### අංක 251 දරණ නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව කෘෂිකර්ම සහ ආහාර කටයුතු පිළිබඳ ඇමති තැන්පත්, මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම මෙම දිවයින තුළ කුමන සහල් වර්ගයකින්වත් කිසියම් ප්‍රමාණයක් ආහාර පාලක හෝ නියෝජ්‍ය ආහාර පාලක හෝ සහකාර ආහාර පාලක විසින් හෝ ඔවුන් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් උඩ එවැනි බල පත්‍රයකට අන්තර්ගත කොන්දේසි අනුව විනා ප්‍රවාහණය කිරීම මෙම නියෝගයෙන් තහනම් කරමි,

මෙම නියෝගයෙන් ඉහත පෙනෙන තහනම් පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) මෙරට වගා කළ හාල් කුමන ප්‍රමාණයක් රථවාහනවලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ;

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් කිසියම් හාලක් රථවාහනවලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ;

(ඇ) හාල් සලාක පොතක් සහිත යමෙකු එම පොතෙන් කිසියම් කූපනයක් භාරදී ලබාගන්නා හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට එම පොත අයිතිකරුගේ නිවාස ස්ථානය කරා රථ වාහනවලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ; හෝ

(ඈ) නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කළ රිසිට්ටුවක් හෝ බලපත්‍රයක් සහිතව හෝ හාල් තොග වෙළෙන්දකු විසින් නිකුත් කළ රිසිට්ටුවක් සහිතව යමෙකු එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් තොග වෙළඳ තැනගේ, සමුපකාරයේ හෝ බලය ලත් වෙළඳ තැනගේ ගබඩාවට හෝ වෙළඳ පොලට රථවාහනවලින් හෝ අන් අයුරකින් ගෙනයාම.

ඉහත (ඈ) යටතේ සඳහන් " තොග වෙළෙන්ද " යනුවෙන් හැඟවෙන්නේ සමුපකාර බඩු ගබඩාවලට හෝ සමුපකාර කඩවලට හෝ බලය ලත් වෙළෙන්දන්ට, පාලනයට යටත්වූ කිසියම් ද්‍රව්‍යයක් බෙද හරින්නෙකු වීම සඳහා 1962 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ III වැනි කොටසේ 5 වැනි රෙගුලාසිය යටතේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකයෙකු විසින් බලය දෙන ලද 1949 අංක 21 දරණ පණතින් සංශෝධිත 1936 අංක 16 දරණ සමුපකාර සමිති ආඥපනතේ 6 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර කඩ සමිති සංගමය, සමුපකාර තොග වෙළඳ ආයතනය හෝ ඒ සඳහා වෙනයම් සුදුසු පුද්ගලයෙකු වේ.

ඉහත (ඇ) යටතේ සඳහන් " බලයලත් වෙළෙන්දෙකු " යනුවෙන් හැඟවෙන්නේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකවරයෙකු විසින් 1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ II වැනි කොටසේ 5 වැනි රෙගුලාසිය යටතේ පාලනයට යටත්වූ කිසියම් ද්‍රව්‍යයක් නියමිත ප්‍රදේශවලට ආයතන වලට හෝ කණ්ඩායම් වශයෙන් සිටින මිනිසුන්ට බෙදහැරීම සඳහා බලය දෙනු ලැබූ වෙළෙන්දෙකුට හෝ ඒ සඳහා සුදුසුවූ වෙනත් පුද්ගලයෙකු වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ආහාර කටයුතු පිළිබඳ ඇමති.

1966 දෙසැම්බර් මස 22 දින.
කොළඹ දීය.

12–1460

1052/29— එච 163— 11,850 (66/12)

ඇල්. ඩී—බී. 36/57.

## 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත

### 33 වැනි වගන්තිය යටතේ ආඥාව

1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා ධීවර ඇමති දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ඉහතකී පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1958 ජනවාරි මස 10 වන දින අංක 11,237 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද නීතිගත සංස්ථාවක් වන ජාතික ඡේෂකර්ම නීතිගත සංස්ථාවේ කාර්යයන් සඳහා මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කර්මාන්ත හා ධීවර ඇමති.

1966 ක්වූ දෙසැම්බර් මස 26 වැනි දින.

### උපලේඛනය

| කට්ටි අංකය | ඉඩමේ නම සහ අයිතිකරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. | මායිම | පිහිටීම |
|---|---|---|---|---|
| 1 ... | පස්යාල, මක්කානිගොඩ, ඇල්. ජී. හැන්ඩි සිංඤෝ, නාන්ගල්ල, අමර කෝන්මුල්ල, ඇම්. ජී. නිලමේ, නාන්ගල්ල, මංගෙදර, ඊ. ඒ. ඒකනායක සහ වත්තල, හේකිත්ත, ඊ. ස්ටෙලා රෝගුස් යන අයට අයත් බෝගහයාය | 20 — — ... | උතුරට : මා ඔය ; නැගෙනහිරට : ඉලුක්වත්තේ ඇල සහ පාර ; දකුණට : තුල්හිරියේ මහ වෙල්යාය බස්නාහිරට: ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයත් රිටිගහයාය සහ රජයට සහ තවත් අයට අයත් බුජ්ජමුකොට | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ රාගල කන්ද ග්‍රාමසේවක වසම |
| 2 ... | වරකාපොල, අඹේපුස්ස වී මෝලෙහි ඇම්. ඒ. ඇම්. අබ්දුල් වඩුඩට අයිති බුජ්ජමුකොට | 10 — — ... | උතුරට : මාඔය ; නැගෙනහිරට, ඇල්. ජී. හැන්ඩි සිංඤෝට සහ තවත් අයට අයිති බෝගහයාය ; දකුණට : ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය ; බස්නාහිරට : අමරකෝන් මුල්ලේ ගම්මායිම | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ රාගල කන්ද ග්‍රාමසේවක වසම |
| 3 ... | පස්යාල, මක්කානිගොඩ, ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය | 16 — — ... | උතුරට : ඇල්. ඩී. හැන්ඩි සිංඤෝට සහ තවත් අයට අයිති බෝගහයාය ; නැගෙනහිරට : තුල්හිරිය මහ වෙල්යාය ; දකුණට : සී. ජේ. ධර්මරත්නට සහ තවත් අයට අයිති ඉලුක් ගොල්ල වත්ත සහ අඹගහයාය ; බස්නාහිරට : ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති ගනේකන්ද සහ අමරකෝන් මුල්ලේ ගම් මායිම | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ රාගල කන්ද ග්‍රාමසේවක් වසම |
| 4 ... | පස්යාල, මක්කානිගොඩ, ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති දන්ලියද්ද වත්ත | 10 — — ... | උතුරට : ඇම්.කිරිබණ්ඩාට සහ තවත් අයට අයිති ගිටිනාවත්ත සහ අමරකෝන් මුල්ලේ ගම් මායිම ; නැගෙනහිරට : මැක්ඩින් සමරනායකට අයිති අඹගහයාය ; දකුණට : එච්. ඒ. මුදියන් සේට අයිති රබර් ඉඩම සහ ජුනයිඩ් සහ තවත් අයට අයිති දන්ලියද්ද කුඹුර ; බස්නාහිරට : සී. ජේ. ධර්මරත්න සහ තවත් අයට අයිති දෙල්ගහගොඩ රබර් ඉඩම | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මංගෙදර ග්‍රාම සේවක වසම |
| 5 ... | දෙනියායේ, වරල්ල, ගෑප්ලින් වත්තේ මැක්සින් සමරනායකට අයිති අඹගහයාය | 10 — — ... | උතුරට : ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය ; නැගෙනහිරට : සී. ජේ. ධර්ම රත්නට සහ තවත් අයට අයිති ඉලුක්ගොල්ල වත්ත සහ ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය ; දකුණට : සී. ජේ. ධර්මරත්නට සහ තවත් අයට අයිති ඉලුක්ගොල්ල වත්ත ; බස්නාහිරට : එච්. ඒ. මුදියන්සේට අයත් රබර් ඉඩම සහ හැන්ඩි සිංඤෝට අයත් දන්ලියද්ද සහ ගනේකන්ද ඉඩම් | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මංගෙදර සහ රාගල කන්ද ග්‍රාමසේවක වසම |
| 6 ... | දෙනියායේ, දෙනියාය වත්තෙහි ලිලියන් ජ්ලොරන්ස් පෙරේරාට අයිති ඉලුක්ගොල්ල වත්ත | 51 — — ... | උතුරට : ඇල් ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය සහ තුල්හිරියේ මහ වෙල්යාය ; නැගෙනහිරට : කොළඹ–කුරුණෑගල ප්‍රසිද්ධ පාර ; දකුණට ; රජයට අයත් මාලිගාතැන්නේ ඉඩම සහ වැව ; බස්නාහිරට : නාන්ගල්ලේ කුඹුරු සහ ගම්මුන්ගේ ඉඩම් | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මංගෙදර සහ රාගල කන්ද ග්‍රාමසේවක වසම |
| 7 ... | පස්යාල, මක්කානිගොඩ, ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති ගනේකන්ද | 6 — — ... | උතුරට : ඇල්. ජී. පුංචිබණ්ඩාට අයිති තුල්හිරියේ වත්ත සහ අමරකෝන් මුල්ලේ ගම් මායිම ; නැගෙනහිරට : ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති රිටිගහයාය ; දකුණට : මැක්සින් සමර නායකට අයිති අඹගහයාය ; බස්නාහිරට : ඇම්. කිරිබංඩාට සහ තවත් අයට අයිති හිටිනාවත්ත සහ ඇල්. ජී. හැන්ඩි සිංඤෝට අයිති දන්ලියද්ද වත්ත | සබරගමුව පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මංගෙදර සහ රාගල කන්ද ග්‍රාමසේවක වසම |
| | | 123 — — | | |

12–1458

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි